// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2203/7 - 2020 නොවැම්බර් මස 23 වැනි සඳුදා - 2020.11.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී- බී 15/2016

**යුද හමුදා පනත (357 වන අධිකාරය)**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු (357 වන අධිකාරය වූ) යුද හමුදා පනතේ 29 වන වගන්තිය සහ 155 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2020 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1989 ජුනි මස 15 වැනි දින අංක 562/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ කලින් කල සංශෝධිත පරිදි වන, 1981 යුද හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය, එහි 29 වන නියෝගයේ (එ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"(ඒ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, 2009 මැයි මස 19 වැනි දින හෝ ඊට පෙර ස්වේච්ඡා බලකායේ අධිකාරියක් ප්‍රදානය කර ඇති සහ එම අධිකාරිය ප්‍රදානය කරන අවස්ථාවේ වයස අවුරුදු 23 ඉක්මවා සිටින උපකරණ පාලක නිලධරයකු නොවන වෙනත් යම් නිලධරයකු විශ්‍රාම යාමේ වයස සම්පූර්ණ වීම මත හෝ ඔහු තවදුරටත් නියුක්ත කරවීමට තරම් සේවයක් නොමැත යන තීරණයේ ප්‍රතිඵලයක් මත විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ උපසේවයට මාරු කරනු ලබන අවස්ථාවේ දී වසර විස්සක (20) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නොකරන්නේ වුවද යටත් පිරිසෙයින් වසර පහළොවක (15) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදයක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් ඔහුට නිත්‍ය බලසේනාවේ නිලධරයකු හා සමානවම විශ්‍රාම වැටුපක් ප්‍රදනය කළ හැකි ය.

(ඔ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, 2009 මැයි මස 19 වන දින හෝ ඊට පෙර ස්වේච්ඡා බලකායේ උපකරණ පාලකවරයකු ලෙස සෘජුව අධිකාරියක් ප්‍රදනය කර ඇති සහ එම අධිකාරිය ප්‍රදනය කරන අවස්ථාවේ වයස අවුරුදු 35 ඉක්මවා සිටින යම් නිලධරයකු හෝ 2009 මැයි මස 19 වන දින හෝ ඊට පෙර නිලයෙන් උසස් කිරීම මත උපකරණ පාලක නිලධරයකු ලෙස අධිකාරිලත් සහ එම අධිකාරිය ප්‍රදනය කරන අවස්ථාවේ වයස අවුරුදු 35 ඉක්මවා සිටින යම් නිලධරයකු, විශ්‍රාම යාමේ වයස සම්පූර්ණ වීම මත හෝ ඔහු තවදුරටත් නියුක්ත කරවීමට තරම් සේවයක් නොමැත යන තීරණයේ ප්‍රතිඵලයක් මත විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ උපසේවයට මාරු කරනු ලබන අවස්ථාවේ දී වසර විස්සක (20) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ නොකරන්නේ වුව ද යටත් පිරිසෙයින් වසර පහළොවක (15) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදයක ලෙස එම සේවය ඉටු කර තිබේ නම් ඔහුට නිත්‍ය බලසේනාවේ උපකරණ පාලකවරයකු හා සමානවම විශ්‍රාම වැටුපක් ප්‍රදනය කළ හැකි ය.

(ඕ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, රජයේ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක හෝ වෙනත් යම් රජයේ ආයතනයක විශ්‍රාම වැටුප් සහිත සේවයක යෙදී සිටි යම් තැනැත්තකු, එසේ සේවයේ යෙදී සිටියදී 2009 මැයි මස 19 වැනි දින හෝ එදිනට පෙර ස්වේච්ඡා බලකායට නිලධරයකු ලෙස බඳවාගෙන ඇති අවස්ථාවක ඔහු එම ස්වේච්ඡා සේවයෙන් නිසි පරිදි මුද හරින අවස්ථාවේ දී හෝ නිසි පරිදි විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී එම රජයේ සේවය සඳහා හෝ ස්වේච්ඡා සේවය සඳහා විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබයි නම් එහෙත් ඔහු ස්වේච්ඡා සේවයේ යටත් පිරිසෙයින් වසර දහයක (10) ගණන් ගත හැකි සේවයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදයක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් සහ රජයේ සේවය සහ ස්වේච්ඡා සේවය සලකා බැලීමේදී එම සේවාවන් දෙකෙහි එකතුව වසර විස්සකට (20) නොඅඩු වන්නේ නම්, ඔහුට 4 වන නියෝගයේ දක්වා ඇති ආකාරයට ගණනය කළ හැකි විශ්‍රාම වැටුපක් ප්‍රදනය කළ හැකි ය.

(ක) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, 2009 මැයි මස 19 වැනි දින හෝ එදිනට පෙර ස්වේච්ඡා බලකායට සෙබලකු ලෙස බඳවාගෙන ඇති සහ එම බඳවා ගන්නා අවස්ථාවේ වයස අවුරුදු 33 ඉක්මවා සිටින යම් තැනැත්තකු, විශ්‍රාම යාමේ අනිවාර්ය වයස් සීමාවට එළඹීම හේතුවෙන් හෝ ඔහු තවදුරටක් නියුක්ත කරවීමට සේවයක් නොමැත යන තීරණයේ ප්‍රතිඵලයක් ලෙස විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ උපසේවයට මාරු කරනු ලබන අවස්ථාවේ දී වසර විසි දෙකක (22) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ නොකරන්නේ වුව ද යටත් පිරිසෙයින් වසර පහළොවක (15) ගණන් ගත හැකි සේවයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදයක ලෙස එම සේවය ඉටු කර තිබේ නම් ඔහුට නිත්‍ය බලසේනාවේ සෙබලකු හා සමානවම විශ්‍රාම වැටුපක් ප්‍රදනය කළ හැකි ය.

(ග) වෙනත් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකු රජයේ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක හෝ වෙනත් යම් රජයේ ආයතනයක විශ්‍රාම වැටුප් සහිත සේවයක යෙදී සිටියදී 2009 මැයි මස 19 වැනි දින හෝ එදිනට පෙර ස්වේච්ඡා බලකායට සෙබලකු ලෙස බඳවාගෙන ඇති අවස්ථාවක ඔහු එම ස්වේච්ඡා සේවයෙන් නිසි පරිදි මුද හරින අවස්ථාවේ දී හෝ නිසි පරිදි විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී එම රජයේ සේවය සඳහා හෝ ස්වේච්ඡා සේවය සඳහා විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබයි නම් එහෙත් ඔහු ස්වේච්ඡා සේවයේ යටත් පිරිසෙයින් වසර දෙළහක (12) ගණන් ගත හැකි සේවයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදයක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් සහ එම රජයේ සේවය සහ ස්වේච්ඡා සේවය සලකා බැලීමේදී එම සේවාවන් දෙකෙහි එකතුව වසර විසි දෙකකට (22) නොඅඩු වන්නේ නම් ඔහුට, 21 වන නියෝගයේ දක්වා ඇති ආකාරයට ගණනය කළ විශ්‍රාම වැටුපක් ප්‍රදනය කරනු ලැබිය හැකි ය".

එල්. ඩී.- බී 16/2016

## නාවික හමුදා පනත (358 වන අධිකාරය)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2020 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1991 මාර්තු මස 20 වැනි දින අංක 654/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ කලින් කල සංශෝධිත පරිදි වන, 1981 නාවික හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 26 වන නියෝගයේ (2) වන ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිව ම දැක්වෙන "(අ)" අනුඡේදය (අංක 1512/19 සහ 2007 අගෝස්තු මස 31 වන දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ඇතුළත් කරන ලද පරිදි) (ආ) අනුඡේදය ලෙස නැවත අංකනය කිරීමෙන් ;

(2) 26 වන නියෝගයේ (2) වන ඡේදයේ නැවත අංකනය කරන ලද (ආ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේද ආදේශ කිරීම මගින් :

"(ඇ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, 2009 මැයි මස 19 වැනි දින හෝ ඊට පෙර නාවික ස්වේච්ඡා බලකායේ අධිකාරියක් ප්‍රදානය කර ඇති සහ එම අධිකාරිය ප්‍රදානය කරන අවස්ථාවේ වයස අවුරුදු 23 ඉක්මවා සිටින යම් නිලධරයකු විශ්‍රාම යාමේ වයස සම්පූර්ණ වීම මත හෝ ඔහු තවදුරටත් නියුක්ත කරවීමට තරම් සේවයක් නොමැත යන තීරණයේ ප්‍රතිඵලයක් මත විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ උපසේවයට මාරු කරනු ලබන අවස්ථාවේ දී වසර විස්සක (20) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ නොකරන්නේ වුවද යටත් පිරිසෙයින් වසර පහළොවක (15) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදායක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් ඔහුට නිත්‍ය නාවික බලසේනාවේ නිලධරයකු හා සමානවම විශ්‍රාම වැටුපක් ප්‍රදානය කළ හැකි ය.

(ඈ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, රජයේ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක හෝ වෙනත් යම් රජයේ ආයතනයක විශ්‍රාම වැටුප් සහිත සේවයක යෙදී සිටි යම් තැනැත්තකු, එසේ සේවයේ යෙදී සිටියදී 2009 මැයි මස 19 වැනි දින හෝ එදිනට පෙර නාවික ස්වේච්ඡා බලකායට නිලධරයකු ලෙස බඳවාගෙන ඇති අවස්ථාවක ඔහු එම ස්වේච්ඡා සේවයෙන් නිසි පරිදි මුදා හරින අවස්ථාවේ දී හෝ නිසි පරිදි විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී එම රජයේ සේවය සඳහා හෝ ස්වේච්ඡා සේවය සඳහා විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබයි නම් එහෙත් ඔහු ස්වේච්ඡා සේවයේ යටත් පිරිසෙයින් වසර දහයක (10) ගණන් ගත හැකි සේවයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදායක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් සහ රජයේ සේවය සහ ස්වේච්ඡා සේවය සලකා බැලීමේදී එම සේවාවන් දෙකෙහි එකතුව වසර විස්සකට (20) නොඅඩු වන්නේ නම් ඔහුට, 4 වන නියෝගයේ දක්වා ඇති ආකාරයට ගණනය කළ හැකි විශ්‍රාම වැටුපක් ප්‍රදණය කළ හැකි ය.".

(3) 26 වන නියෝගයේ (3) වන ඡේදයේ (ආ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනු ඡේද ආදේශ කිරීම මගින් :-

"(ඇ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, 2009 මැයි මස 19 වැනි දින හෝ එදිනට පෙර නාවික ස්වේච්ඡා බලකායට නාවිකයකු ලෙස බඳවාගෙන ඇති සහ එම බඳවා ගන්නා අවස්ථාවේ වයස අවුරුදු 33 ඉක්මවා සිටින යම් තැනැත්තකු විශ්‍රාම යාමේ අනිවාර්ය වයස් සීමාවට එළඹීම හේතුවෙන් හෝ ඔහු තවදුරටත් නියුක්ත කරවීමට සේවයක් නොමැත යන තීරණයේ ප්‍රතිඵලයක් ලෙස විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ උපසේවයට මාරු කරනු ලබන අවස්ථාවේ දී වසර විසි දෙකක (22) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ නොකරන්නේ වුවද,

යටත් පිරිසෙයින් වසර පහළොවක (15) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදායක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් ඔහුට නිත්‍ය නාවික බලසේනාවේ නාවිකයකු හා සමානවම විශ්‍රාම වැටුපක් ප්‍රදනය කළ හැකි ය.

(ඈ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකු රජයේ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක හෝ වෙනත් යම් රජයේ ආයතනයක විශ්‍රාම වැටුප් සහිත සේවයක යෙදී සිටියදී 2009 මැයි මස 19 වැනි දින හෝ එදිනට පෙර නාවික ස්වේච්ඡා බලකායට නාවිකයකු ලෙස බඳවාගෙන ඇති අවස්ථාවක ඔහු එම ස්වේච්ඡා සේවයෙන් නිසි පරිදි මුද හරින අවස්ථාවේ දී හෝ නිසි පරිදි විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී එම රජයේ සේවය සඳහා හෝ ස්වේච්ඡා සේවය සඳහා විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබයි නම් එහෙත් ඔහු ස්වේච්ඡා සේවයේ යටත් පිරිසෙයින් වසර දෙළහක (12) ගණන් ගත හැකි සේවයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදායක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් සහ එම රජයේ සේවය සහ ස්වේච්ඡා සේවය සලකා බැලීමේදී එම සේවාවන් දෙකෙහි එකතුව වසර විසි දෙකකට (22) නොඅඩු වන්නේ නම් ඔහුට, 18 වන නියෝගයේ දක්වා ඇති ආකාරයට ගණනය කළ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.".

12 - 25

---

එල්. ඩී.- බී 17/2016

## ගුවන් හමුදා පනත (359 වන අධිකාරය)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 වන වගන්තිය යටතේ සහ 155 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2020 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1991 ජනවාරි මස 16 වැනි දින අංක 645/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ කලින් කල සංශෝධිත පරිදි වන, 1981 ගුවන් හමුද විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය, එහි 34 වන නියෝගයේ (උ) ඡේදයට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීම මගින් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ ඃ

"(ඌ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, 2009 මැයි මස 19 වැනි දින හෝ ඊට පෙර ස්වේච්ඡා බලකායේ අධිකාරියක් ප්‍රදනය කර ඇති සහ එම අධිකාරිය ප්‍රදනය කරන අවස්ථාවේ වයස අවුරුදු 23 ඉක්මවා සිටින යම් නිලධරයකු විශ්‍රාම යාමේ වයස සම්පූර්ණ වීම මත හෝ ඔහු තවදුරටත් නියුක්ත කරවීමට තරම් සේවයක් නොමැත යන තීරණයේ ප්‍රතිඵලයක් මත විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ උපසේවයට මාරු කරනු ලබන අවස්ථාවේ දී වසර විස්සක (20) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ නොකරන්නේ වුවද යටත් පිරිසෙයින් වසර පහළොවක (15) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදායක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් ඔහුට නිත්‍ය ගුවන් හමුදවේ නිලධරයකු හා සමානවම විශ්‍රාම වැටුපක් ප්‍රදනය කළ හැකි ය.

(එ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, රජයේ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක හෝ වෙනත් යම් රජයේ ආයතනයක විශ්‍රාම වැටුප් සහිත සේවයක යෙදී සිටි යම් තැනැත්තකු, එසේ සේවයේ යෙදී සිටියදී 2009 මැයි මස 19 වැනි දින හෝ ඊට පෙර ස්වේච්ඡා බලකායට නිලධරයකු ලෙස බඳවාගෙන ඇති අවස්ථාවක ඔහු එම ස්වේච්ඡා සේවයෙන් නිසි පරිදි මුද හරින අවස්ථාවේ දී හෝ නිසි පරිදි විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී එම රජයේ සේවය සඳහා හෝ ස්වේච්ඡා සේවය සඳහා විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබයි නම් එහෙත් ඔහු ස්වේච්ඡා සේවයේ යටත් පිරිසෙයින් වසර

දහයක (10) ගණන් ගත හැකි සේවයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදයක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් සහ රජයේ සේවය සහ ස්වේච්ඡා සේවය සලකා බැලීමේදී එම සේවාවන් දෙකෙහි එකතුව වසර විස්සකට (20) නොඅඩු වන්නේ නම් ඔහුට, 4 වන නියෝගයේ දක්වා ඇති ආකාරයට ගණනය කළ හැකි විශ්‍රාම වැටුපක් ප්‍රදානය කළ හැකි ය.".

(ඒ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, 2009 මැයි මස 19 වැනි දින හෝ එදිනට පෙර ගුවන් භටයකු ලෙස ස්වේච්ඡා බලකායට බඳවාගෙන ඇති සහ එම බඳවා ගන්නා අවස්ථාවේ වයස අවුරුදු 33 ඉක්මවා සිටින යම් තැනැත්තකු විශ්‍රාම යාමේ අනිවාර්ය වයස් සීමාවට එළඹීම හේතුවෙන් හෝ ඔහු තවදුරටත් නියුක්ත කරවීමට සේවයක් නොමැත යන තීරණයේ ප්‍රතිඵලයක් ලෙස විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී හෝ උපසේවයට මාරු කරනු ලබන අවස්ථාවේ දී වසර විසි දෙකක (22) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ නොකරන්නේ වුවද යටත් පිරිසෙයින් වසර පහළොවක (15) ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදයක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් ඔහුට නිත්‍ය ගුවන් හමුදවේ ගුවන් භටයකු හා සමානවම විශ්‍රාම වැටුපක් ප්‍රදනය කළ හැකි ය.

(ඔ) වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකු රජයේ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක හෝ වෙනත් යම් රජයේ ආයතනයක විශ්‍රාම වැටුප් සහිත සේවයක යෙදී සිටියදී 2009 මැයි මස 19 වැනි දින හෝ එදිනට පෙර ස්වේච්ඡා බලකායට ගුවන් භටයකු ලෙස බඳවාගෙන ඇති අවස්ථාවක ඔහු එම ස්වේච්ඡා සේවයෙන් නිසි පරිදි මුදා හරින අවස්ථාවේ දී හෝ නිසි පරිදි විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී එම රජයේ සේවය සඳහා හෝ ස්වේච්ඡා සේවය සඳහා විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබයි නම් එහෙත් ඔහු ස්වේච්ඡා සේවයේ යටත් පිරිසෙයින් වසර දොළහක (12) ගණන් ගත හැකි සේවයක් සම්පූර්ණ කර තිබේ නම් හා සතුටුදයක ලෙස එම සේවය ඉටුකර තිබේ නම් සහ එම රජයේ සේවය සහ ස්වේච්ඡා සේවය සලකා බැලීමේදී එම සේවාවන් දෙකෙහි එකතුව වසර විසි දෙකකට (22) නොඅඩු වන්නේ නම් ඔහුට, 18 වන නියෝගයේ දක්වා ඇති ආකාරයට ගණනය කළ හැකි විශ්‍රාම වැටුපක් ප්‍රදාණය කළ හැකි ය.".

12 - 26

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.